සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ගිණුම්කරණය I<br>கணக்கீடு I<br>Accounting I | **33** | **S** | **I** |

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

※ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

※ අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**

※ සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.

※ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

※ **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගනුදෙනු සටහන් කිරීම
(2) නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
(3) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ආයතනයක් පිළිබඳ තොරතුරු සැපයීම
(4) ආයතනයක් පිළිබඳ තොරතුරු එහි කළමනාකරුවන්ගේ භාවිතය සඳහා වාර්තා කිරීම
(5) ආයතනයක වාර්ෂික බාහිර විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් තොරතුරු සැපයීම (……)

**2.** ආයතනයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි, වත්කම් සහ වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පහත කුමන ගිණුම්කරණ සංකල්පය **පදනම** සපයනු ලබයි ද?
(1) උපචිත (2) සංගතතා (3) අඛණ්ඩ පැවැත්ම
(4) ප්‍රමාණාත්මකබව (5) කාලච්ඡේද (……)

**3.** කල්බදු ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි භාවිත අයිතිය සහිත වත්කම් හඳුනා ගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය **පදනම** සපයනු ලබයි ද?
(1) ඒකක (2) සංගතතා (3) කාලච්ඡේද
(4) යථාරූපී (5) විචක්ෂණ (……)

● **අංක 4, 5 සහ 6 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මිහිරි විසින් රු. 500 000 ක මුදලක් හා රු. 400 000 ක් වටිනා ලී බඩු ආයෝජනය කරමින් 2023.01.01 දින වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය මෙදිනම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි කරන ලදී. කෙසේ වුව ද, ගැනුම් මත VAT නොමැති බව උපකල්පනය කරන්න.
පහත ගනුදෙනු 2023 ජනවාරි මාසය තුළදී සිදු විය.

| ගනුදෙනු අංකය | දිනය | ගනුදෙනුව |
|---|---|---|
| 1 | 01.05 | පිරිවැය රු. 400 000 ක් වූ භාණ්ඩ දේශාන් ට්‍රේඩර්ස් වෙතින් ණයට මිල දී ගන්නා ලදී. |
| 2 | 01.08 | දේශාන් ට්‍රේඩර්ස්ගෙන් මිල දී ගත් රු. 30 000 ක භාණ්ඩ ආපසු යවන ලදී. |
| 3 | 01.15 | පිරිවැය රු. 250 000 ක් වූ භාණ්ඩ රු. 345 000 කට අත්පිට මුදලට විකුණන ලදී (රු. 45 000 ක VAT ඇතුළත්ව). |
| 4 | 01.22 | පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ රු. 138 000 කට ණයට විකුණන ලදී (රු. 18 000 ක VAT ඇතුළත්ව). |
| 5 | 01.25 | දේශාන් ට්‍රේඩර්ස්ට ගෙවිය යුතු මුදල පියවීම සඳහා චෙක්පතක් නිකුත් කරන ලදී. |

[දෙවැනි පිටුව බලන්න.

Visit EDUHUB

**4.** ගනුදෙනු අංක **1**, **2** සහ **3** ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව මිහිරිගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන මොනවා ද?

(1) ඉන්වොයිසිය, හරපත, ඉන්වොයිසිය

(2) ඉන්වොයිසිය, බැරපත, ඉන්වොයිසිය

(3) ඉන්වොයිසිය, හරපත, ලදුපත

(4) ගෙවීම් වවුචරය, බැරපත, ලදුපත

(5) ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය, ලදුපත (......)

**5.** මිහිරිගේ **ආරම්භක ආයෝජනය** සහ ගනුදෙනු අංක **3** සහ **5** ඒවා සිදු වූ අනුපිළිවෙළින් සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලික සටහන් පොත් කවරේ ද?

(1) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය

(2) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය

(3) පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය

(4) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය

(5) පොදු ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය (......)

**6.** ගනුදෙනු අංක **3** සහ **4** හි **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | වත්කම් (රු.' 000) | = | වගකීම් (රු.' 000) | + | හිමිකම (රු.' 000) |
|---|---|---|---|---|---|
| (1) | + 70 | | + 63 | | + 7 |
| (2) | + 115 | | + 45 | | + 70 |
| (3) | + 133 | | 0 | | + 133 |
| (4) | + 133 | | + 45 | | + 88 |
| (5) | + 133 | | + 63 | | + 70 |

(......)

**7.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමඟි පොදු සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ලද ලාභය රු. 360 000 ක් විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත වැරදි අනාවරණය විය.

- මෝටර් රථ දෙවන වර ප්‍රත්‍යාගණනය කිරීමෙන් වර්ෂය තුළදී ඇති වූ රු. 120 000 ක අතිරික්තය, වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුව ද, මෙම අතිරික්තය ගිණුම්ගත කිරීමේදී මෝටර් රථ වෙනුවෙන් පසුගිය වර්ෂයක හඳුනාගත් ප්‍රත්‍යාගණන හිඟය වූ රු. 80 000 සැලකිල්ලට ගෙන නොතිබුණි.
- ප්‍රවර්තන වර්ෂයට අදාළ ඡායාපිටපත් යන්ත්‍රයේ නඩත්තු වියදම වූ රු. 30 000 ක් 2022.04.01 දින ගෙවන ලද අතර එය කාර්යාල උපකරණ ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කර තිබුණි. වර්ෂය සඳහා කාර්යාල උපකරණවල පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කර ඇත.

ඉහත වැරදි නිවැරදි කළ පසු 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය කොපමණ ද?

(1) රු. 216 000 (2) රු. 250 000 (3) රු. 256 000

(4) රු. 290 000 (5) රු. 296 000 (......)

**8.** අරුණි ට්‍රේඩර්ස් තේවල ස්වාමි ව්‍යාපාරයකි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පිරිවැය රු. 20 000 ක් වූ තොගයක් සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර එම අලාභයෙන් 80% ක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කරන ලදී. තොග හානිය සහ රක්ෂණ වන්දිය සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත. කෙසේ වුව ද, 2023.03.31 දිනට පැවති භෞතික තොගය මත අවසාන තොගය ආගණනය කර ඇත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය සහ ශුද්ධ ලාභය පිළිවෙළින් රු. 150 000 ක් සහ රු. 80 000 ක් විය.

තොග හානිය සහ රක්ෂණ වන්දිය ගිණුම් පොත්වල නිසි පරිදි ගළපා තිබුණේ නම්, **නිවැරදි** දළ ලාභය සහ ශුද්ධ ලාභය කොපමණ ද?

| | දළ ලාභය (රු.) | ශුද්ධ ලාභය (රු.) |
|---|---|---|
| (1) | 146 000 | 76 000 |
| (2) | 150 000 | 84 000 |
| (3) | 166 000 | 76 000 |
| (4) | 170 000 | 76 000 |
| (5) | 170 000 | 96 000 |

(......)

[තුන්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

● **අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන ව්‍යාපාරයක් වන සීමිත අරලිය පොදු සමාගම එහි මෙහෙයුම් කටයුතු 2022.04.01 දින ආරම්භ කරන ලදී. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවලට අදාළව පහත තොරතුරු දී ඇත.

| | **වටිනාකම (රු. මිලියන)** |
|---|---|
| 2022.04.01 දින මිල දී ගත් යන්ත්‍රවල පිරිවැය (ඵලදායී ජීවකාලය වසර 10 කි). | 8 000 |
| මිල දී ගත් අමුද්‍රව්‍යවල පිරිවැය | 5 500 |
| ඍජු ශ්‍රම පිරිවැය | 4 000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (යන්ත්‍ර ක්ෂය හැර) | 800 |

**අතිරේක තොරතුරු:**

- මිල දී ගත් අමුද්‍රව්‍යවලින් 20% ක් 2023.03.31 දිනට තොගය ලෙස ඉතිරිව ඇත.
- 2023.03.31 දිනට නොනිමි තොගය රු. මිලියන 450 ක් විය. නොනිමි තොග ප්‍රාථමික පිරිවැයට අගය කරනු ලබයි.
- රුපියල් මිලියන 550 ක පිරිවැය වූ අමුද්‍රව්‍ය වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම විනාශ විය.

**9.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය කොපමණ ද?
(1) රු. මිලියන 7 400 (2) රු. මිලියන 7 850 (3) රු. මිලියන 7 950
(4) රු. මිලියන 8 200 (5) රු. මිලියන 8 950 (......)

**10.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
(1) රු. මිලියන 9 000 (2) රු. මිලියන 9 200 (3) රු. මිලියන 9 450
(4) රු. මිලියන 9 550 (5) රු. මිලියන 10 000 (......)

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

කේවල ස්වාමි ව්‍යාපාරයක් වන පියුමි ට්‍රේඩර්ස් එහි ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම ව්‍යාපාරයට අදාළ තොරතුරු සමහරක් පහත දී ඇත.

| | **2023.03.31 දිනට (රු.'000)** | **2022.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකමට | 5 000 | 3 000 |
| තොගය | ? | 1 800 |
| වෙළෙඳ ණයගැතියෝ | 1 500 | 1 000 |
| වෙළෙඳ ණයහිමියෝ | 1 200 | 800 |

2023.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මෙහෙයුම් වියදම් රු. 250 000 ක් වර්ෂය තුළදී මුදලින් ගෙවන ලදී. තවද මෙම වර්ෂය තුළදී වෙළෙඳ ණයගැතියන්ගෙන් රු. 3 000 000 ක් එකතු කර ගන්නා ලද අතර, රු. 2 500 000 ක් වෙළෙඳ ණයහිමියන්ට ගෙවන ලදී. සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනමට සිදුකරනු ලබයි. වර්ෂය තුළදී පිරිවැය රු. 2 250 000 ක් වූ උපකරණ මිල දී ගත් අතර, දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීම් සිදු වී නොමැත. පිරිවැය මත 25% ක ලාභයක් සහිතව ආයතනය විසින් භාණ්ඩ විකුණනු ලබයි.

**11.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය:
(1) රු. 1 875 000 (2) රු. 2 000 000 (3) රු. 2 100 000
(4) රු. 2 625 000 (5) රු. 2 800 000 (......)

**12.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය සහ 2023.03.31 දිනට තොගය:

| | **ශුද්ධ ලාභය (රු.'000)** | **2023.03.31 දිනට තොගය (රු.'000)** |
|---|---|---|
| (1) | 200 | 1 900 |
| (2) | 200 | 2 075 |
| (3) | 375 | 1 900 |
| (4) | 375 | 2 075 |
| (5) | 450 | 1 900 |

(......)

**13.** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සියලු හවුල්කරුවන් ලාභාලාභ සම සමව බෙදා ගැනීමට හිමිකමක් ලබයි.

B - විශ්‍රාම යන හවුල්කරුවකුට, ඔහු/ඇය විශ්‍රාම යන අවස්ථාවේදී ලැබිය යුතු මුදල මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට අයිතියක් ඇත.

C - සෑම හවුල්කරුවකුටම හවුල් ව්‍යාපාරයේ කළමනාකරණයට සහභාගි විය හැකි නමුත් ඒ සඳහා වේතනයක් ලැබීමට අයිතියක් නොමැත.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

[හතරවැනි පිටුව බලන්න.

Visit EDUHUB

● අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

පියල්, ලාල් සහ නිල් විසින් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදි. 2022.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි විය.

| | පියල් (රු.'000) | ලාල් (රු.'000) | නිල් (රු.'000) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 6 000 | 4 000 | 2 000 |
| ජංගම ගිණුම් - බැර | 800 | 600 | 400 |

හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව, සෑම හවුල්කරුවකුම රු. 800 000 බැගින් වාර්ෂික වේතනයකට සහ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට ද හිමිකම් ලබයි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 5 100 000 ක කෙටුම්පත් ලාභයක් වාර්තා කර ඇත. පියල් විසින් හවුල් ව්‍යාපාරයේ ප්‍රවර්තන වර්ෂයේ වියදම් සඳහා රු. 300 000 ක් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇති නමුත් එය හවුල් ව්‍යාපාරයේ පොත්වල ගිණුම්ගත කර නොමැත.

2023.03.31 දින නිල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදි. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපිය යුතු වේ. මෙදිනට නිල්ට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කරන ලදි. පියල් සහ ලාල් විසින් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය තවදුරටත් පවත්වා ගැනීමට එකඟ විය.

**14.** 2023.03.31 දිනට පියල්ගේ ජංගම ගිණුමේ ශේෂය:

(1) රු. 2 200 000 (2) රු. 2 300 000 (3) රු. 2 600 000
(4) රු. 2 900 000 (5) රු. 3 000 000 (......)

**15.** නිල්ගේ විශ්‍රාම යෑම සඳහා ගැළපීම් කළ පසු, 2023.03.31 දිනට පියල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සහ නිල්ගේ ණය ගිණුමේ ශේෂය:

| | ප්‍රාග්ධන ගිණුම - පියල් (රු.'000) | ණය ගිණුම - නිල් (රු.'000) |
|---|---|---|
| (1) | 5 800 | 2 400 |
| (2) | 5 800 | 4 200 |
| (3) | 6 400 | 2 600 |
| (4) | 6 400 | 4 200 |
| (5) | 6 600 | 2 600 |

(......)

● අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමා පොදු සමාගමේ ගිණුම් වාර්තාවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | රු.'000 |
|---|---|
| විකුණුම් | 4 500 |
| දළ ලාභය | 2 100 |
| වෙනත් ආදායම් | 600 |
| බදු පෙර ලාභය | 1 200 |
| බදු පසු ලාභය | 800 |

2023.03.31 දින මෙම සමාගමේ යන්ත්‍ර දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු. 700 000 ක අතිරික්තයක් ඇති විය. මෙම ප්‍රත්‍යාගණනය නොසලකා හරිමින් ප්‍රවර්තන වර්ෂය සඳහා සමාගමේ ලාභය ගණනය කර තිබුණි.
මෙම යන්ත්‍ර 2020.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් හඳුනාගෙන තිබූ ඌනතාව රු. 300 000 ක් විය.

**16.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු ආදායම සහ මුළු වියදම:

| | මුළු ආදායම (රු.'000) | මුළු වියදම (රු.'000) |
|---|---|---|
| (1) | 5 100 | 3 700 |
| (2) | 5 100 | 3 900 |
| (3) | 5 400 | 4 300 |
| (4) | 5 800 | 3 900 |
| (5) | 5 800 | 4 300 |

(......)

**17.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම සහ මුළු විස්තීරණ ආදායම:

| | වෙනත් විස්තීරණ ආදායම (රු.'000) | මුළු විස්තීරණ ආදායම (රු.'000) |
|---|---|---|
| (1) | 400 | 800 |
| (2) | 400 | 1 500 |
| (3) | 400 | 1 800 |
| (4) | 700 | 800 |
| (5) | 700 | 1 200 |

(......)

[පස්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

**18.** 'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - තොග පිරිවැය සෑම විටම පිරිවැය සූත්‍රයක් පදනම්ව ගණනය කළ යුතු වේ.

B - ශුද්ධ උපලබ්ධි අගයට තොග කපා හැරීමෙන් ඇතිවන අලාභය, වියදමක් ලෙස එය සිදු වූ කාලච්ඡේදය තුළ හඳුනාගැනේ.

C - සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා පවත්වාගනු ලබන වත්කම් තොග ලෙස සලකනු ලබයි.

(1) A පමණි. (2) C පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

**19.** සීමිත ජනක පොදු සමාගම 2022.04.01 දින සංස්ථාපනය කරන ලදි. මෙම සමාගම සම්පූර්ණයෙන්ම සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් මූල්‍යනය කර ඇත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | රු.'000 |
|---|---|
| අත්පිට විකුණුම් | 1 500 |
| ණයට විකුණුම් | 3 600 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 1 600 |
| මෙහෙයුම් වියදම් | 1 100 |
| ගෙවූ ආදායම් බදු | 200 |

සියලු ගැනුම්, ණය පදනම මත සිදු කර ඇත.

වර්ෂයේ මෙහෙයුම් වියදම් තුළ රු. 500 000 ක ක්ෂය වියදම් ඇතුළත් විය. 2023.03.31 දිනට වෙළෙඳ ණයගැතියෝ රු. 900 000 ක් විය. 2023.03.31 දිනට ඉදිරියට ගෙවූ වියදම් හෝ උපචිත වියදම් නොතිබුණි.

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 1 800 000 (2) රු. 1 900 000 (3) රු. 2 300 000
(4) රු. 3 200 000 (5) රු. 3 900 000 (......)

**20.** සීමිත අමා පොදු සමාගම 2020.04.01 දින පිරිවැය රු. 3 600 000 ක් වූ යන්ත්‍රයක් මිල දී ගන්නා ලදි. මෙදිනට යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 8 ක් සහ රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. 2022.04.01 දින මෙම යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය සමාලෝචනය කරන ලදි. ඒ අනුව, ආරම්භයේ දී ඇස්තමේන්තු කරන ලද යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 6 ක් සහ රු. 600 000 ක් ලෙස සංශෝධනය කරන ලදි.

'LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ' ප්‍රමිතයට අනුව, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මෙම යන්ත්‍රයේ ක්ෂය වියදම:

(1) රු. 333 333 (2) රු. 366 667 (3) රු. 500 000
(4) රු. 550 000 (5) රු. 700 000 (......)

**21.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමුදු පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2023.05.20 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදි.

- සමාගමට එරෙහිව ගොනුකර තිබූ නඩුවක් සම්බන්ධයෙන් වන්දියක් ලෙස රු. 600 000 ක් ගෙවන ලෙස 2023.05.01 දින උසාවි නියෝගයක් ලැබුණි. මෙම නඩුව සම්බන්ධයෙන් රු. 800 000 ක වන්දි සඳහා ප්‍රතිපාදනයක් 2023.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි.
- සමාගමේ ණයගැතියකු බුන්වත් වී ඇති බව 2023.05.10 දින ප්‍රකාශයට පත් කරන ලදි. 2023.03.31 දිනට මෙම ණයගැතියාගෙන් ලැබිය යුතු මුදල රු. 600 000 ක් විය.

ඉහත සිද්ධීන් සැලකිල්ලට ගැනීමට පෙර, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 3 500 000 ක් විය.

'LKAS 10 - වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතයට අනුකූල වන පරිදි අදාළ ගැලපීම් කිරීමෙන් පසු, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය කොපමණ ද?

(1) රු. 2 700 000 (2) රු. 3 100 000 (3) රු. 3 300 000
(4) රු. 3 500 000 (5) රු. 3 700 000 (......)

**22.** 'LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතයට අනුව, පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - අසම්භාව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගත යුතු ය.

B - අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනා නොගත යුතු ය.

C - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබන්නේ විය හැකි බැඳීමක් ඇති විට පමණි.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි. (......)



Visit EDUHUB

**23.** සිසිල් බීම නිෂ්පාදනය කරන සමාගමකට අදාළ තොරතුරු පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| 2023.01.01 දිනට තොගය | 5 500 |
| **2023.12.31 දිනට:** | |
| – ජංගම වත්කම් | 15 000 |
| – ජංගම වගකීම් | 7 500 |

- ජංගම වත්කම් තුළ තොගය රු. 6 500 000 ක් ද ඉදිරියට කළ ගෙවීම් රු. 2 500 000 ක් ද ඇතුළත්ව ඇත.
- 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය රු. 36 000 000 ක් වේ.

වර්ෂයක් සඳහා වැඩ කරන දින ගණන 360 ක් ලෙස උපකල්පනය කරන්න.

සමාගමේ ක්ෂණික වත්කම් අනුපාතය සහ තොග රැඳවුම් කාලය:

| | **ක්ෂණික වත්කම් අනුපාතය** | **තොග රැඳවුම් කාලය (දින)** |
|---|---|---|
| (1) | 0.80 | 60 |
| (2) | 0.80 | 65 |
| (3) | 1.13 | 60 |
| (4) | 1.13 | 65 |
| (5) | 1.25 | 60 |

(……)

**24.** කළමනාකරණ ගිණුම්කරණ වාර්තා සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ආයතනයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශ්වයන් සඳහා කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කරනු ලබයි.

B - කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීම අනිවාර්ය නොවේ.

C - කළමනාකරුවන්ට අවශ්‍යතාවයක් ඇති වූ ඕනෑම අවස්ථාවකදී කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කරනු ලබයි.

D - පුරෝකථනය කරන ලද තොරතුරු පමණක් කළමනාකරණ ගිණුම්කරණ වාර්තා තුළින් සපයනු ලබයි.

(1) B හා C පමණි. (2) A, B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (……)

**25.** තනි භාණ්ඩයක් පමණක් නිෂ්පාදනය කරන සමාගමක් එහි මෙහෙයුම් 2022.04.01 දින ආරම්භ කරන ලදී. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී දරන ලද පිරිවැය පහත පරිදි විය.

| **ඒකකයක විචල්‍ය පිරිවැය:** | **රු.** |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | 90 |
| සෘජු ශ්‍රමය | 50 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 60 |

මුළු ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 1 750 000 ක් විය.

වාර්ෂික නිෂ්පාදනය ඒකක 25 000 ක් වේ.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය:

(1) රු. 200 (2) රු. 240 (3) රු. 270
(4) රු. 298 (5) රු. 338 (……)

**26.** නිෂ්පාදන සමාගමක පොදුකාර්ය පිරිවැය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - පොදුවේ දරන ලද නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, පිරිවැය මධ්‍යස්ථානවලට විභජනය කෙරේ.

B - මුළු පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය අතර වෙනස මුළු පොදුකාර්ය පිරිවැය වේ.

C - යන්ත්‍ර පැය හෝ ශ්‍රම පැය මත පමණක් පදනම්ව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කරනු ලබයි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A සහ C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (……)

**27.** නිෂ්පාදිතයක 'පිරිවැය-පරිමා-ලාභ' විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු විකුණුම් වටිනාකම, මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

B - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය සම්පූර්ණයෙන්ම ආවරණය කර ගැනේ.

C - සමච්ඡේදන මට්ටමෙන් ඔබ්බට විකුණනු ලබන සෑම ඒකකයක් සඳහාම ලැබෙන දායකය සහ ලාභය එකිනෙකට සමාන වේ.

(1) B පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B සහ C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (……)

[ගත්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

● අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

සමාගමක් විසින් 'A' සහ 'B' යන භාණ්ඩ වර්ග දෙකක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. පළමු මෙහෙයුම් වර්ෂයට අදාළ අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| | 'A' | 'B' |
|---|---|---|
| නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත ඒකක ගණන | 8 000 | 2 000 |
| ප්‍රාථමික පිරිවැය (රු.) | 280 000 | 120 000 |
| ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රම පැය | 5 | 6 |

**වෙනත් තොරතුරු:**

| | |
|---|---|
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | රු. 416 000 |
| මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | රු. 208 000 |
| මුළු ශ්‍රම පැය ගණන | 52 000 |

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සහ නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ශ්‍රම පැය මත අන්තර්ග්‍රහණය කරයි. මුළු පිරිවැය මත 25% ක ලාභයක් එකතු කරමින් භාණ්ඩවල විකුණුම් මිල තීරණය කරනු ලබයි.

**28.** 'A' භාණ්ඩයේ ඒකකයක ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය සහ ඒකකයක මුළු පිරිවැය:

| | ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය (රු.) | ඒකකයක මුළු පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 60 | 76 |
| (2) | 75 | 95 |
| (3) | 75 | 100 |
| (4) | 80 | 95 |
| (5) | 80 | 100 |

(......)

**29.** 'B' භාණ්ඩයේ ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල:

(1) රු. 75 (2) රු. 135 (3) රු. 144 (4) රු. 165 (5) රු. 176 (......)

**30.** ව්‍යාපාරයක් විසින් 'X' සහ 'Y' යන ව්‍යාපෘති දෙක සලකා බලමින් සිටී. එක් එක් ව්‍යාපෘතියේ කාලය වසර 5 බැගින් වේ. පහත තොරතුරු මෙම ව්‍යාපෘති සඳහා අදාළ වේ.

| | 'X' ව්‍යාපෘතිය (රු.'000) | 'Y' ව්‍යාපෘතිය (රු.'000) |
|---|---|---|
| යන්ත්‍ර ගැනුම් මිල | 8 250 | 7 525 |
| යන්ත්‍ර ප්‍රවාහන සහ සවිකිරීමේ පිරිවැය | 150 | 125 |
| ආරම්භක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය | 250 | 325 |
| වසර 1 සිට 5 දක්වා ශුද්ධ මුදල් ප්‍රවාහයන්වල වර්තමාන අගය | 9 566 | ? |
| ශුද්ධ වර්තමාන අගය | ? | 948 |

මෙම ව්‍යාපෘති ඇගයීමේදී කළමණාකරුවකු විසින් පහත ප්‍රකාශ සිදු කර ඇත.

A- 'X' ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය රු. 916 000 ක් වේ.
B- 'Y' ව්‍යාපෘතියේ ආරම්භක මුදල් ගලායෑම් රු. 7 650 000 ක් වේ.
C- 'Y' ව්‍යාපෘතියේ වසර 1 සිට 5 දක්වා ශුද්ධ මුදල් ප්‍රවාහයන්වල වර්තමාන අගය රු. 8 923 000 ක් වේ.

මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

(1) A පමණි. (2) C පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**31.** 'LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පහත එක් එක් ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|---|
| A - | අදාළ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරයි. | .................. |
| B - | තම අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි තොරතුරු සපයන ලෙස සමාගමට නියම කළ නොහැකි පරිශීලකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පිළියෙල කරයි. | .................. |
| C - | ආයතනයක අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරිත්වයේ තක්සේරුව මත පිළියෙල කරනු ලබයි. | .................. |
| D - | ආයතනයක මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ තොරතුරු උපචිත පදනමට මෙන්ම මුදල් පදනමට ද සපයනු ලබයි. | .................. |

[අවසැති පිටුව බලන්න

Visit EDUHUB

**32.** වෙළෙඳ ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ දක්වනු ලබන **හිමිකමේ** වටිනාකම කෙරෙහි පහත එක් එක් ගනුදෙනුවේ **ශුද්ධ බලපෑම** (අගය ද සහිතව) සඳහන් කරන්න.

| ගනුදෙනුව | ශුද්ධ බලපෑම වැඩි වේ (I) / අඩු වේ (D) / වෙනස් නොවේ (NC) | අගය (රු.'000) (අදාළ නම්) |
|---|---|---|
| A - වර්ෂයට අදාළ රු. 600 000 ක පොලිය ද සහිතව රු. 1 250 000 ක් වූ ණය වාරිකය ගෙවීම | .................... | .................. |
| B - ලැයිස්තුගත මිල රු. 2 500 000 ක් වූ භාණ්ඩ 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට මිල දී ගැනීම | .................... | .................. |

● **අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් තුළින් සිදුකරනු ලබයි. 2023 දෙසැම්බර් මාසය සඳහා මෙම ව්‍යාපාරයේ මුදල් ගිණුමෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| 2023.12.01 දිනට මුදල් ගිණුමේ ශේෂය (හර) .................... | 200 |
| 2023.12.31 දිනට මුදල් ගිණුමේ ශේෂය (හර) .................... | 800 |

| 2024.01.04 දින ලද 2023 දෙසැම්බර් මාසය සඳහා බැංකු ප්‍රකාශනයේ සාරාංශය: | රු.'000 |
|---|---|
| 2023.12.01 දිනට බැර ශේෂය .................... | 200 |
| උපලබ්ධි වූ මුළු චෙක්පත් .................... | 2 200 |
| ගෙවීම් සඳහා ඉදිරිපත් කළ මුළු චෙක්පත් .................... | 1 500 |
| සෘජු ප්‍රේෂණ (ආයෝජන ආදායම) .................... | 300 |
| ස්ථාවර නියෝග ගෙවීම - ණය වාරිකය (රු. 30 000 ක පොලිය ද ඇතුළත්ව) .......... | 50 |
| 2023.12.31 දිනට ශේෂය .................... | ? |

සෘජු ප්‍රේෂණ සහ ස්ථාවර නියෝග ගෙවීම මුදල් ගිණුමේ සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබුණු පසුව ය. තවද, ගනුදෙනුකරුවකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු. 200 000 ක චෙක්පතක් අගරු වී ඇත. මෙම අගරු වූ චෙක්පත සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත.

**33.** පහත දෑ හඳුනාගන්න:

| **2023.12.31 දිනට:** | **වටිනාකම (රු.'000)** | **ශේෂය (හර/බැර)** |
|---|---|---|
| (අ) බැංකු ප්‍රකාශනයේ ශේෂය | .......................... | .......................... |
| (ආ) මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය | .......................... | .......................... |

**34.** පහත දෑ සටහන් කිරීම සඳහා ද්විත්ව සටහන් ලියන්න (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.*):

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| (අ) රු. 200 000 ක චෙක්පත අගරු වීම: | | |
| (ආ) ස්ථාවර නියෝග ගෙවීම - රු. 50 000 ක් වූ ණය වාරිකය (රු. 30 000 ක පොලිය ද ඇතුළත්ව): | | |

[නවවැනි පිටුව බලන්න.

Visit EDUHUB

**35.** **වඩාත් උචිත** ගිණුම්කරණ සංකල්ප භාවිත කරමින් පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් සහ ණයහිමියන් හඳුනාගැනීම සඳහා ............................. සංකල්පය පදනම සපයනු ලබයි.

B - කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ලාභ බෙදාහැරීමක් ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ ............................. සංකල්පයට අනුව ය.

C - කාලය හෝ වටිනාකම අවිනිශ්චිත වන වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනාගැනීමට ............................. සංකල්පය පදනම සපයනු ලබයි.

D - සාධාරණ අගයට දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම, ............................. **සංකල්පයෙන්** බැහැර වන අවස්ථාවකට උදාහරණයක් වේ.

**36.** නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව පහත වගන්ති/සමීකරණ සම්පූර්ණ කරන්න.

A ගින්නක් නිසා හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය ............................. ප්‍රකාශනයෙහි හඳුනාගැනේ.

B නොනිමි තොගය ............................. පිරිවැය හෝ මුළු නිෂ්පාදන පිරිවැය මත අගය කරනු ලබයි.

C ආරම්භක අමුද්‍රව්‍ය තොගය + මිල දී ගත් අමුද්‍රව්‍ය - අවසාන අමුද්‍රව්‍ය තොගය = .............................

D ආරම්භක නිමි භාණ්ඩ තොගය + මුළු නිෂ්පාදන පිරිවැය - අවසාන නිමි භාණ්ඩ තොගය = .............................

**37.** සමගි ක්‍රීඩා සමාජයේ 2023.01.01 දිනට සාමාජිකයින් සංඛ්‍යාව 300 ක් විය. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 1 000 ක් වේ. සාමාජික මුදල්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| 2023.01.01 දිනට කලින් ලද සාමාජික මුදල් | රු. 30 000 |
| 2023.01.01 දිනට හිඟහිටි සාමාජික මුදල් | රු. 40 000 |

2023.01.01 දිනට හිඟහිටි සාමාජිකයින් 30 දෙනෙකු විය. ඔවුන්ගෙන් සාමාජිකයින් 20 දෙනෙකු 2022 දෙසැම්බර් මාසය සඳහා හිඟහිටි සාමාජික මුදලත්, ප්‍රවර්තන වර්ෂයට අදාළ සම්පූර්ණ සාමාජික මුදලත් 2023 වර්ෂය තුළදී ගෙවා තිබුණි. ඉතිරි හිඟහිටි සාමාජිකයින් 10 දෙනා, 2022 වර්ෂයේ අවසාන මාස දෙක සඳහා හිඟ මුදල සහ 2023 වර්ෂයට අදාළ සම්පූර්ණ සාමාජික මුදල ද 2023.12.31 දින දක්වා ගෙවා නොතිබුණි.

2023.01.01 දිනට කලින් ලද සාමාජික මුදල් සියල්ල 2023 වර්ෂයට අදාළ වේ.

අනෙක් සියලු සාමාජිකයින් ඔවුන්ගේ සාමාජික මුදල් නිසි පරිදි ගෙවා තිබුණි.

පහත දෑ හඳුනාගන්න:

(අ) 2023.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් (රු.'000) : .............................

(ආ) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ලද මුළු සාමාජික මුදල් (රු.'000) : .............................

**38.** හවුල් ව්‍යාපාරයකට අදාළව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|
| A - ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැකි ය. | .................. |
| B - හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20 දෙනෙකුට සීමා කර ඇත්තේ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව ය. | .................. |
| C - හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ගළපනු ලබන්නේ නව හවුල්කරුවකු ඇතුළත් කර ගන්නා අවස්ථාවකදී පමණි. | .................. |
| D - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අතිරේකව ඔවුන් ලබාදී ඇති ණය සඳහා 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හිමිකම් ලබයි. | .................. |



Visit EDUHUB

**39.** රවි සහ සඳුන් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. පහත තොරතුරු හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලින් උපුටා ගන්නා ලදි.

| | රවි (රු.'000) | සඳුන් (රු.'000) |
|---|---|---|
| 2022.04.01 දිනට ශේෂය (බැර) | 3 000 | 2 000 |
| හවුල්කරුවන්ගේ වේතන | 1 400 | 1 200 |
| හවුල්කරුවන්ට ගෙවූ වේතන | (1 000) | (1 000) |
| ප්‍රාග්ධනය මත පොලිය | 800 | 400 |
| ලාභ කොටස | ? | ? |
| 2023.03.31 දිනට ශේෂය (බැර) | 5 100 | 3 500 |

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ හඳුනාගන්න:

(අ) රවිගේ ලාභ කොටස (රු.'000) : ……………………………

(ආ) සඳුන්ට විසර්ජනය කරන ලද මුළු ලාභය (රු.'000) : ……………………………

(ඉ) හවුල් ව්‍යාපාරයේ ලාභය (රු.'000) : ……………………………

**40.** මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට (2018) අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළියෙල කරනු ලබන්නේ ……………………… උපකල්පනය මත ය.

B - ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව සඳහා ඇති අයිතිය ………………………………… ලෙස නිර්වචනය කෙරේ.

C - මිනුම්කරණ පදනමක් තෝරාගැනීමේදී සලකා බලන සාධක දෙක වන්නේ ……………………………… සහ ………………………………………………………… වේ.

**41.** සීමිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වලට අදාළව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| A - | **හිමිකම් කොටස් නිකුතුව සමාගමේ හිමිකම** සහ වත්කම් යන දෙකෙහිම වැඩිවීමට හේතු වේ. | …………… |
| B - | **කොටස් නිකුතුවකදී අයදුම්පත් සමග ලද මුදල් සෘජුවම** කොටස් ප්‍රාග්ධන ගිණුමට බැර කරනු ලබයි. | …………… |
| C - | **කොටස් විභජනය සෑම විටම සමානුපාතික** විභජන ක්‍රමය මත සිදුකළ යුතු ය. | …………… |
| D - | **සංචිත ප්‍රාග්ධනීත කිරීම, සමාගමේ කොටස්** හිමියන් සංඛ්‍යාව වැඩිවීමට හේතු වේ. | …………… |

**42.** 2023 මාර්තු මාසය සඳහා ඇඟලුම් නිෂ්පාදන සමාගමක භාවිත කරන ලද අමුද්‍රව්‍යයක් (කපුරෙදි) සඳහා පහත තොරතුරු අදාළ වේ.

| **දිනය** | **විස්තරය** |
|---|---|
| 01 | ආරම්භක තොගය - මීටර් 500 (මීටරයක ගැනුම් මිල රු. 2 000 කි.) |
| 10 | කර්මාන්තශාලාවට නිකුත් කිරීම් - මීටර් 300 |
| 20 | මිල දී ගැනීම් - මීටර් 400 ක් මීටරයක් රු. 2 500 බැගින් |
| 31 | කර්මාන්තශාලාවට නිකුත් කිරීම් - මීටර් 360 |

'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව පහත එක් එක් පිරිවැය සූත්‍ර ක්‍රමය යටතේ 2023.03.31 දිනට මෙම අමුද්‍රව්‍යයේ තොග පිරිවැය කොපමණ ද?

(අ) පෙර-පිවිසි පෙර-පිට ක්‍රමය (FIFO) අනුව පිරිවැය (රු.'000) : ……………………………

(ආ) භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය (WAC) අනුව පිරිවැය (රු.'000) : ……………………………

**43.** 'LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි' ප්‍රමිතයට අනුව පහත එක් එක් අවස්ථාව **ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමක්** ද **ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමක්** ද යන්න සඳහන් කරන්න.

| | **අවස්ථාව** | **ප්‍රතිපත්ති වෙනස්වීමක් / ඇස්තමේන්තු වෙනස්වීමක්** |
|---|---|---|
| A - | ක්ෂය ක්‍රමය, සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම | ……………………… |
| B - | දේපළ, පිරියත හා උපකරණ මිනුම් කිරීමේ ක්‍රමය, පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම | ……………………… |
| C - | ක්ෂය කළ හැකි වත්කමක ඵලදායී ජීවකාලය වෙනස් කිරීම | ……………………… |
| D - | තොග පිරිවැය මිනුම් කරන සූත්‍රය භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයේ සිට පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම | ……………………… |

[එකොළොස්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

**44.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන සමාගමක ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | රු.'000 |
|---|---|
| දිගුකාලීන ණය | 12 000 |
| වර්ෂය සඳහා පොලී වියදම | 1 200 |
| වර්ෂය සඳහා ආදායම් බදු වියදම | 800 |

ප්‍රවර්තන වර්ෂය සඳහා හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය පිළිවෙළින් 20% ක් සහ 60% ක් ලෙස ගණනය කර ඇත.

පහත දෑ හඳුනාගන්න:

(අ) 2023.03.31 දිනට හිමිකම (රු.'000) : ......................................

(ආ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය (රු.'000) : ......................................

(ඉ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලී ආවරණ අනුපාතය (වාර) : ......................................

**45.** පහත තොරතුරු සමාගමක නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 120 000 |
| එක් ඇණවුමක ප්‍රමාණය ඒකක 3 000 ක් වන්නේ නම් වාර්ෂික ඇණවුම් පිරිවැය | රු. 60 000 |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | රු. 10 |

පහත දෑ හඳුනාගන්න:

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) (ඒකක) : ..........................

(ආ) වරකට EOQ ඇණවුම් කරන්නේ නම් මුළු වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය (රු.) : ..........................

**46.** සීමිත අමර පොදු සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් වේ. ඒකක 25 000 ක මෙහෙයුම් ධාරිතා මට්ටමේදී එහි පිරිවැය තොරතුරු පහත දී ඇත.

- මුළු පිරිවැය රු. 7 500 000
- මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 2 500 000
- මුළු විචල්‍ය පිරිවැය, මුළු පිරිවැයෙන් 60% කට සමාන වේ.
- ප්‍රාථමික පිරිවැය සමන්විත වන්නේ විචල්‍ය පිරිවැයෙන් පමණි.
- ඒකකයක් සඳහා විචල්‍ය පොදුකාර්ය පිරිවැය රු. 70 ක් වේ.
- ඒකකයක් සඳහා විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 40 ක් වේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය (රු.) : ......................................

(ආ) මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000) : ......................................

(ඉ) මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (රු.'000): ......................................

**47.** ආයතනයක් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයක් සඳහා භාවිත කරන 'A', 'B' සහ 'C' යන අමුද්‍රව්‍ය තුන සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | A | B | C |
|---|---|---|---|
| ඒකකයක් සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය (කිලෝ ග්‍රෑම්) | 10 | 8 | 6 |
| යළි ඇණවුම් ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | 20 000 | 15 000 | 20 000 |
| යළි ඇණවුම් මට්ටම (කිලෝ ග්‍රෑම්) | ? | 24 000 | 15 000 |
| පොරොත්තු කාලය (සති): | | | |
| අවම | 2 | 4 | 3 |
| උපරිම | 4 | 6 | 5 |

මෙම භාණ්ඩයේ සතියක නිෂ්පාදනය ඒකක 300 සිට 500 දක්වා පරාසයේ විචලනය වේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) 'A' අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම (කිලෝ ග්‍රෑම්) : ......................................

(ආ) 'B' අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම (කිලෝ ග්‍රෑම්): ......................................

(ඉ) 'C' අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම (කිලෝ ග්‍රෑම්) : ......................................



Visit EDUHUB

**48.** පහත තොරතුරු නිෂ්පාදන ආයතනයක වේතනවලට අදාළ වේ.

- එක් සේවකයෙකු සඳහා මාසික සම්මත නිෂ්පාදනය ඒකක 800 ක් වේ.
- සම්මත නිෂ්පාදන මට්ටම දක්වා ඒකකයක් සඳහා එක් සේවකයෙකුට රු. 100 ක් ගෙවනු ලැබේ.
- සම්මත නිෂ්පාදන මට්ටම ඉක්මවා නිෂ්පාදනය කරනු ලබන සෑම ඒකකයක් සඳහාම රු. 120 ක් ගෙවනු ලැබේ.
- 2023 ජනවාරි මාසය සඳහා සේවකයන් දෙදෙනෙකුගේ සත්‍ය නිෂ්පාදනය:

| සේවක අංකය | සත්‍ය නිෂ්පාදනය (ඒකක) |
|---|---|
| 001 | 950 |
| 002 | 800 |

- මෙම ආයතනයේ ගබඩා භාරකරු (සේවක අංක 003) සඳහා දිනකට රු. 1 000 ක් ගෙවනු ලබන අතර, ඔහු දෛනික පදනම මත 2023 ජනවාරි මාසයේදී දින 25 ක් වැඩ කරන ලදී.
- එක් සේවකයෙකු සඳහා රු 5 000 බැගින් මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

2023 ජනවාරි මාසය සඳහා මෙම ආයතනයේ පහත දෑ හඳුනාගන්න:

(අ) මුළු ශ්‍රම පිරිවැය (රු.) : ......................................

(ආ) මුළු සෘජු ශ්‍රම පිරිවැය (රු.) : ......................................

(ඉ) මුළු වක්‍ර ශ්‍රම පිරිවැය (රු.) : ......................................

**49.** සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරමින් සිටියි. 2024 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා පහත ඇස්තමේන්තු පිළියෙල කර ඇත.

| | **ජනවාරි** | **පෙබරවාරි** |
|---|---|---|
| ප්‍රාථමික පිරිවැය (රු.) | 480 000 | 600 000 |
| මුළු පොදුකාර්ය පිරිවැය (රු.) | 520 000 | 600 000 |
| නිෂ්පාදනය (ඒකක) | 8 000 | 10 000 |

**අතිරේක තොරතුරු:**

- මෙම භාණ්ඩයේ සියලු ප්‍රාථමික පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.
- මුළු පොදුකාර්ය පිරිවැය තුළ විචල්‍ය සහ ස්ථාවර පොදුකාර්ය පිරිවැය යන දෙකම ඇතුළත් වේ.
- මෙම කාල සීමාව තුළ, ස්ථාවර පොදුකාර්ය පිරිවැය නොවෙනස්ව පවතී.
- ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල රු. 125 ක් වේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) ඒකකයක් සඳහා විචල්‍ය පිරිවැය (රු.) : ......................................

(ආ) දායක විකුණුම් අනුපාතය : ......................................

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක) : ......................................

**50.** සමාගමක් විසින් යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටියි. මෙම යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායි ජීවකාලය වසර 5 කි. මෙම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් පහත දී ඇත.

| | **රු.'000** |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් පිරිවැය | 8 250 |
| ආරම්භයේ දී යන්ත්‍රය සඳහා අවශ්‍ය වන කාරක ප්‍රාග්ධනය | 1 000 |
| වාර්ෂික ශුද්ධ මුදල් ගලාඒම් | 3 300 |
| යන්ත්‍රයේ ඵලදායි ජීවකාලය අවසානයේ සුන්බුන් අගය | 1 250 |

යන්ත්‍රයේ ඵලදායි ජීවකාලය අවසානයේදී කාරක ප්‍රාග්ධනය අයකර ගත හැකි ය. සරල මාර්ග ක්‍රමය මත යන්ත්‍රය ක්ෂය කරනු ලබයි.

යන්ත්‍රය සඳහා පහත දෑ හඳුනාගන්න:

(අ) පිළිගෙවුම් කාලය (වසර) : ......................................

(ආ) 5 වන වර්ෂයේ : ......................................

(ඉ) ගිණුම්කරණ ප්‍ර: : ......................................

Visit EDUHUB